


**මාගේ සැමියා ස්ථිර ඕස්ට්‍රේලියානු පදිංචිකරුවෙකු (Permanent Resident) වන අතර මා මීට මාස 5කට පෙර ඔහු සමඟ විවාහ වී ශ්‍රී ලංකාවේ සිට පැමිණියෙමි. නමුත් ඔහුගෙන් මා හට ඉතා දරුණු වදහිංසා සිදුවූ අතර මේ හේතුවෙන් මා ඔහුගෙන් වෙන්වී කන්‍යාරාමයක ආරක්ෂාව යටතේ සිටිමි. මාගේ වීසා තත්වයට මෙය බලපාන්නේ කෙසේද?**

1. **මාගේ ෆෙඩරල් උසාවි (Federal Court) වැඩකටයුතු දැන් නිමාවී ඇත. මම ඕස්ට්‍රේලියාවට පැමිණි බෝට්ටු සංක්‍රමණිකයෙක් වෙමි. තවදුරටත් ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීම සඳහා මා හට ඉහළ උසාවියකට අයදුම් කළ නොහැකිද?**

   නිශන් Mulgrave

   ඔබගේ ෆෙඩරල් උසාවි වැඩකටයුතු නිමාවී ඔබගේ වාසියට නඩුව තීන්දු වී නොමැති නම්, ඔබට ඉන් උසස් උසාවිය වන ඉහළ අධිකරණය (High Court) වෙත අභියාචනා කළ හැකිය. මෙය ඔබගේ ෆෙඩරල් උසාවි නියෝගයෙන් දින 21ක් ඇතුලත කරන්නේ නම් වඩා ප්‍රතිඵලදායක වේ.

2. **වැසීගිය එදිනෙදා ආහාර අලෙවිසැලක් (Grocery shop) සහ භෝජනාගාරයක් මිලට ගෙන අළුතින් ව්‍යාපාර කටයුතු ඇරඹීමට මා අදහස් කරමි. මෙම ගණුදෙනුව අත්පිට මුදලට සිදුකිරීමට සහ නීතිඥ නියෝජනයක් නොමැතිව සිදුකිරීමට විකුණුම්කරු මා හට යෝජනා කරයි. එසේ මෙම ගණුදෙනුව සම්පූර්ණ කිරීම කොයිතරම් දුරට මා හට ආරක්ෂිත වේද?**

   සුසිල් - Hampton Park

   වැසීගිය හෝ පවතින ව්‍යාපාරයක් මිලට ගැනීමේදී හා විකිණීමේදී ඒ සඳහා සම්පූර්ණ කළයුතු නීතිමය අවශ්‍යතා රැසක් පවතී. මෙය නීතිඥ මැදිහත්වීමෙන් තොරව සිදුකලහොත් ඔබ දෙපාර්ශවයම එම නීතිමය අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම මත විවිධ ගැටළු වලට මුහුණ දෙනු ඇත. අත්පිට මුදලට ගණුදෙනුව සම්පූර්ණ කිරීමේදීද ඔබට ආරක්ෂිත තත්වයක් උදා නොවිය හැකිය. එබැවින් නීතිඥ සහය ලබාගෙන අදාල ගණුදෙනුව නිසි පරිදි නීතිමය අවශ්‍යතා සම්පූර්ණ කර සිදුකිරීමෙන් දෙපාර්ශවයටම නෛතික ආරක්ෂාව සැලසෙන බව පහදාගන්න.

3. **මාගේ සැමියා ස්ථිර ඕස්ට්‍රේලියානු පදිංචිකරුවෙකු (Permanent Resident) වන අතර මා මීට මාස 5කට පෙර ඔහු සමඟ විවාහ වී ශ්‍රී ලංකාවේ සිට පැමිණියෙමි. නමුත් ඔහුගෙන් මා හට ඉතා දරුණු වදහිංසා සිදුවූ අතර මේ හේතුවෙන් මා ඔහුගෙන් වෙන්වී කන්‍යාරාමයක ආරක්ෂාව යටතේ සිටිමි. මාගේ වීසා තත්වයට මෙය බලපාන්නේ කෙසේද?**

   නම සඳහන් කිරීමට අකමැති තැනැත්තියක්

   ඔබ සහකාර වීසා (Partner visa) යටතේ ඕස්ට්‍රේලියාවට පැමිණ ඇත. නමුත් ඔබ දැනට පසුවන්නේ තාවකාලික සහකාර වීසා (Temporary Partner visa) තත්වයේය. යම් හෙයකින් ඔබේ සැමියා ඔබගේ වෙන්වීම ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටියහොත් ඔබ දැනට දරණ තාවකාලික වීසාව ඉකුත් වී ඔබට නැවත ශ්‍රී ලංකාවට යාමට සිදුවෙයි. නමුත් ඕස්ට්‍රේලියානු රජය පවුල් හිංසනයට විරුද්ධ බැවින් ඔබට පවුල් හිංසනයට ( Family Violance) ලක්වූවෙකුට ලබාදෙන ආරක්ෂාව යටතේ ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිය සඳහා අයදුම් කළ හැකිය. එබැවින් හැකි ඉක්මනින් අදාල සාක්ෂි ගොනු කරගෙන අයදුම් කරන්න.

4. **මාගේ වෙන්වූ බිරිඳ, මා ඉදිරිපත් කළ මූල්‍ය ගිවිසුමට (Binding Financial Agreement) එකඟ නැත. අපගේ දේපල ප්‍රශ්න හැකි ඉක්මනින් නිරාකරණය කර ගැනීමට අවශ්‍යය. මේ සඳහා මා දැන් කුමක් කළ යුතුද?**

   ජේසන් – Epping

   ඔබ දෙපාර්ශවයට අධිකරණයෙන් පිටත මූල්‍ය ගිවිසුමක් යටතේ ඔබගේ දේපල ප්‍රශ්න විසඳා ගත නොහැකි නම්, මේ සඳහා දැන් අධිකරණයේ සහය පැතිය යුතුය. අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඔබට මේ සඳහා කඩිනම් විය හැකිය.

WARNALEGAL
Justice for all
நீதி உபகார | சட்ட சேவைகள்
Need Legal Help? Call us Now
FAMILY LAW
AUSTRALIAN LEGAL ADVICE
MIGRATION LAW
SRI LANKAN LEGAL ADVICE
CONVEYANCING
COMMERCIAL & BUSINESS LAW
LITIGATION
POWERS OF ATTORNEY & WILLS
ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
SRI LANKAN DEEDS AND COMPANY REGISTRATION SERVICE



Madhu Warnakulasuriya LL.B
Solicitor and Barrister
Registered Migration Agent
(MARN 1068979)
Attorney at Law in Sri Lanka

SWORN TRANSLATIONS • NAATI TRANSLATIONS
03 9792 9977

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1
www.warnalegal.com

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2